# 2023 - ශිෂ්‍යත්වය






077 90 29 607 - ඉනෝකා ටීචර්

# අවධානය යොමු කළ යුතු ප්‍රධාන කරුණු

1. මාතෘකාව අවබෝධ කර ගැනීම.

2. ලිවිය යුතු කාලය අවබෝධ කර ගැනීම.

3. මාතෘකාවට ගැළපෙන ආකාරයට කරුණු 3 ක් නිර්මාණය කර ගැනීම.

4. උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි ව නිර්මාණශීලි වාක්‍ය 3 ක් පැහැදිලි අත් අකුරින් ලිවීම.

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 1. මාතෘකාව අවබෝධ කර ගැනීම.

- සිදුවීමක් ද ?
- ක්‍රියාවක් ද ?
- සිතුවිල්ලක් ද ?

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# 2. ලිවිය යුතු කාලය අවබෝධ කර ගැනීම

* වර්තමාන කාලය
* අනාගත කාලය
* අතීත කාලය

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 3. මාතෘකාවට ගැළපෙන ආකාරයට කරුණු තුනක් නිර්මාණය කිරීම.

* පැහැදිලි අත් අකුරින් අක්ෂර වින්‍යාසය නිවැරදි ව ලිවිය යුතු ය .

* ලිඛිත බසින් ලිවිය යුතු ය.

* උත්ක ආඛ්‍යාත සම්භන්ධතාවය නිවැරදි විය යුතු ය.

* නිර්මාණශීලී අදහස් ගොඩ නැගිය යුතු ය.

077 90 29 607 - ඉනෝකා ටීචර්

# දරුවන් වරද්දන තැන්.

1. මාතෘකාව සමඟ ලබා දී ඇති උපදෙස් හා අනෙකුත් කරුණු නිවැරදි ව කියවා අවබෝධ කර නො ගැනීම.
2. මාතෘකාවට අදාළ ව කරුණු ගොනු කරනවා වෙනුවට ඉන් පරිබාහිර ව වාක්‍ය ගොඩ නැගීම
3. එක ම දේ නැවත නැවත නැවත පුන පුනා ලිවීම.
4. මාතෘකාව නැවත වාක්‍යයකට ලිවීම
5. ඉතාමත් දිගින් යුතු වාක්‍ය ලිවීම
6. උක්ත ආඛ්‍යාත සම්බන්ධය , අක්ෂර වින්‍යාසය නිවැරදි නොවීම
7. ලිඛිත බසින් නො ලිවීම.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# පසුගිය ශිෂ්‍යත්ව රචනා මාතෘකා

2018 - .................. මේ අවස්ථාවේ ඔබට සිතුණු දේ..

2019 - යාළුවා කළ උදව්ව මට තාම මතකයි.

**2020 - පාසල් වසා තිබූ කාලය මා ගත කළ අයුරු**

**2021 - කූඩුවක ඇති කරන කුරුල්ලෙකු පිළිබඳ ව මට හිතෙන දේ**

**2022 - ...... ඉන් පසුව ඔබ සිදු කරන්නේ කුමක් ද ?**

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

2023 - මාතෘකාව

# බලාපොරොත්තු වන්න

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 2018 ශිෂ්‍යත්වය - මාතෘකාව

**2018 - චිත්‍ර තරඟයකින් පළමු වන ස්ථානය දිනූ කුමුදුට චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීමට ජපානයට යෑම සඳහා ආරාධනාවක් ලැබුණි. කුමුදු ඔබ යැයි සිතා , මේ අවස්ථාවේ ඔබට සිතුණු දේ පිළිබඳව වාක්‍ය තුනක් ලියන්න.**

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# මාතෘකාවට අනුව කරුණු ගොනු කරන

1.එම ප්‍රීතිමත් ආරංචිය ලද මොහොතේ ඔබට හැඟුණු දේ පිළිබඳව මුලින් ම ලියන්න.

2.ඉන් පසු ජපානයට ගොස් නැරඹිය හැකි දේ ගැන ඔබට හිතෙන දේ ගැන පමණක් ලියන්න.

3. අතීත කාලයෙන් පමණක් ලිවිය යුතු ය. ( **සිතුණු දේ** )

4.මෙම ජයග්‍රහණය ලබා ගැනීමට ඔබ කළ කැපවීම ගැන මෙනෙහි කළ හැක.

5. ලබා ගත් මේ පන්නරය තුළින් අනාගතයේ කිරීමට බලාපොරොත්තු වන දේ ගැන සිතෙන ආකාරය ලිවිය හැක.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

- 2018 - චිත්‍ර තරඟයකින් පළමු වන ස්ථානය දිනූ කුමුදුට චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීමට ජපානයට යෑම සඳහා ආරාධනාවක් ලැබුණි. කුමුදු ඔබ යැයි සිතා , මේ අවස්ථාවේ ඔබට සිතුණු දේ පිළිබඳව වාක්‍ය තුනක් ලියන්න.

- 1.එම සතුටුදායක ආරංචිය ලත් මගේ සිත අමන්දානන්දයට පත් වුණි.
- 2. නිදි වර්ජිත රැයවල් පසු කරමින් කළ කැප කිරීම ගැන සිහි වී මට නිහතමානි ආඩම්බරක් දැනුණි.
- 3. සුන්දර සකුරා දේශයේ මා සතුටින් ඇවිද යන ආකාරය මට මැවී පෙනෙන්නට විය.
- 4. මේ ආරංචිය දෙමාපියන්නට දන්වන විට ඔවුන්ගේ මුහුණු සතුටින් බැබළෙන ආකාරය මට සිහයට නැගුණි.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# 2019 - ශිෂ්‍යත්වය මාතෘකාව

20219 - යාළුවා කළ උදව්ව මට තාම මතකයි.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# මාතෘකාවට අනුව කරුණු ගොනු කරන අයුරු

- යාළුවා කළ එක් උදව්වක් ගැන පමණක් ලිවිය යුතු ය.
- එම උදව්ව ගැන කරුණු 3ක් වාක්‍ය 3කට ගොනු කළ යුතු ය.
- අතීත කාලයෙන් ලිවිය යුතු ය. ( කළ උදව්ව )

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 20219 - යාළුවා කළ උදව්ව මට නාම මතකයි.

- 1. දිනක් අම්මා අසනීප ව සිටි නිසා මට උදේ ආහාරය පාසලට ගෙන යාමට නොහැකි විය.
- 2. විවේක කාලයේ දී මම ක්‍රීඩා පිටියේ අඹ ගස යට වාඩි වී  සිටියෙමි.
- 3. මගේ  යහළුවා  මා අසළට ම පැමිණ ඔහුගේ ආහාරය මා සමග බෙදා ගත් අයුරු මට නාම මතක ය.

077 90 29 607  - ඉනෝකා ටීචර්

# 2020 - ශිෂ්‍යත්වය මාතෘකාව

2020 - පාසල් වසා තිබූ කාලය මා ගත කළ අයුරු

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# මාතෘකාවට අනුව කරුණු ගොනු කරන අයුරු

- කොරෝනා නිවාඩුව කාලය බැවින් එම කාලය තුළ ඔබ කළ දේවල් 3 ක් ලිවිය යුතුය .
- අතීත කාලයෙන් ලිවිය යුතු ය.
- අධ්‍යාපනය ලද ආකාරය , නිවැසියන් සමග සතුටින් කාලය ගත කළ ආකාරය , නිවසේ හා ගෙවත්තේ වැඩවලට උදවු කළ ආකාරය , යහළුවන් සමඟ සෙල්ලම් කළ ආකාරය ගැන ලිවිය හැක.

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 2020 - පාසල් වසා තිබූ කාලය මා ගත කළ අයුරු

- 1. ගුරුතුමිය විසින් ලබා දුන් සියලු ම ගෙදර වැඩ අම්මා සමඟ එකතු වී වේලාවට ම නිම කළෙමි.
- 2. හවස්වරුවේ යහළුවන් සමඟ එකතු වී සෙල්ලම් කළෙමි.
- 3. සමාජ මාධ්‍යවල පළ වූ අධ්‍යාපනික වීඩියෝ නරඹා මගේ දැනුම වර්ධනය කර ගත්තෙමි.
- 4. ලොකු අම්මාලාගෙ ගෙදර ගොස් ඇති තරම් වෙළේ සෙල්ලම් කළෙමි.

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 2021 - ශිෂ්‍යත්වය -මාතෘකාව

## 2021 - කූඩුවක ඇති කරන කුරුල්ලෙකු පිළිබඳ ව මට හිතෙන දේ

077 90 29 607 - ඉනෝකා ටීචර්

# මාතෘකාවට අනුව කරුණු ගොනු කරන අයුරු

- 1.එක් කූඩුවක ඇති කරන එක් කුරුල්ලෙකු ගැන පමණක් ලිවිය යුතු ය.
- 2.එම කුරුල්ලා ගැන ඔබට හිතෙන දේ ගැන පමණක් ම ලිවිය යුතු ය.
- 3. වර්තමාන කාලයෙන් පමණක් ලිවිය යුතු ය. ( හිතෙන දේ )
- 4. එම කුරුල්ලා ගැන ඔබට හිතෙන කාරණා 3ක් නිර්මාණශීලී ව ලිවිය යුතු ය.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# 2021 - කූඩුවක ඇති කරන කුරුල්ලෙකු පිළිබඳ ව මට හිතෙන දේ

1. තමාගේ පරපුරේ අය නිදහසේ පියාඹන විට උඹ කූඩුවේ දුකෙන් සිටිනු බව මට පෙනෙයි.

2. අනේ මේ කුරුල්ලාට ත් ගසින් ගසට  පියාඹා ඇති තරම් පලතුරු කන්නට ඇත්නම් කොපමණ සතුටු වෙයි ද කියා මට සිතෙයි.

3. තනිකම පාළුව සමඟ ජීවත්වන කුරුල්ලා සමඟ කූඩු වෙන්නට මටත් හැකිනම් කොපමණ අගනේ ද කියා මට සිතේ.

077 90 29 607  - ඉනෝකා ටීචර්

# 2022 - ශිෂ්‍යත්වය මාතෘකාව

2022- මිතුරන් සමග උදෑසනින් ම පාසල් යෑමට පැමිණෙන ඔබ පාර හරහා ගසක් වැටී තිබෙන අයුරු දකියි. අහල පහල වෙනත් කිසිවෙක් ද නැත. ඔබගේ අධිෂ්ඨානය කෙසේ හෝ පාසල් යාමයි. ඉන් පසුව සිදු කරන්නේ කුමක් ද ? යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න.

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 2022 මාතෘකාවට කරුණු ගොනු කරන ආකාරය

- ඉන් අනතුරුව ඔබ කරන දේ ගැන විමසන බැවින් අනාගත කාලයෙන් ලිවිය යුතු ය.
- ඉන් අනතුරුව කරන දේ ගැන පමණක් ලිවිය යුතු අතර හැඳින්වීමට ලබා දී ඇති විස්තරය ගැන නැවත නොලිවිය යුතු ය.
- ඒ ස්ථානයේ කිසි ම කෙනෙක් නොමැති බැවින් කවුරුන් ව හෝ උදව්වට කැඳවන ආකාරය හා ඉන් අනතුරුව ඔබ කරන දේවල් 2ක් ගැන ලිවිය හැක.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

# 2022 ශිෂ්‍යත්වය -මාතෘකාව

1.අසළ පිහිටි නිවසකට ගොස් සිදු වී ඇති දෙය පවසා ඔවුන් සමඟ අදාළ ස්ථානයට පැමිණෙමි.

2. පාරේ ගමන් කරන අනෙක් අයව ද නවතා , මෙම සිදුවීම ගැන පවසන්නෙමි.

3. ඉන් අනතුරුව ඔවුන් සියල්ලන් සමඟ එකතු වී ගස පාරෙන් ඉවත් කිරීමට උත්සහ කරන්නෙමි.

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

මේ අවුරුදු 5ම පැමිණී මාතෘකා ගැන හොඳින් විමසූ විට ඔබට දැනෙන හැඟෙන දේ මොනවා ද ?

- ”මම” යන පුද්ගලයා අඩංගු වී තිබීම.

077 90 29 607 - ඉනෝකා ටීචර්

- 2023 ද මම අන්තර්ගත විය හැක..

**077 90 29 607 - ඉනෝකා ටීචර්**

20203 අනුමානා රචනා 5 ක් බලාපොරොත්තු වන්න.

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 2023 - අනුමාන රචනා මාතෘකා පහ

- 1. පරිසරය සුරැකීමට මගේ දායකත්වය.
- 2. දිර්ඝ ඉඩෝරයකට පසු අපේ ගමට වැස්සක් ආවා.
- 3.ගුණ දම් පිරිහෙන සමාජයක එය රැක ගැනීම වෙනුවෙන් මගෙන් විය යුතු දේ.
- 4.තාක්ෂණික දියුණුවත් සමඟ කාර්යබහුල ජීවිත ගත කරන අපිට තව වසර 20කින් පසුව සිදු විය හැකි දේ.
- 5. අපේ ගම ගංවතුරෙන් යට වූ දා .

077 90 29 607 - ඉනෝකා ටීචර්

# 1.පරිසරය සුරැකීමට මගේ දායකත්වය

1.පන්ති කාමරයෙන් පිටවන අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමට මම දායක වෙමි.

2.පරිසරය සුරැකීමේ අගය ගැන දැක්වෙන පෝස්ටර් ප්‍රදර්ශනයක් පවත්වමි.

3.සෑම දවසක් ම රුක් රෝපණ දිනයක් ලෙස සලකන්නට අන් අයට උපදෙස් දෙමි.

- 4.“පරිසරය සුරකිමු” යන මාතෘකාව ගැන බිත්ති පුවත්පත රචනාවක් ලියමි.

077 90 29 607 - ඉනෝකා ටීචර්

## 2. දිර්ඝ ඉඩෝරයකට පසු අපේ ගමට වැස්සක් ආවා.

- 1.වැහි බිඳු ආදරයෙන් වැළඳ ගත් මිහිකත සතුටින් උදම් වනන්නට විය.
- 2. හිරු රශ්මියෙන් පීඩා විඳි පරිසරය එක වර ම සිසිල් වන්නට විය.
- 3. මියැදෙන්නට අර අඳිමින් සිටි ගස්වැල් නැවත ජීවත් වීමේ බලාපොරොත්තු දල්වා ප්‍රීතිමත් වන්නට විය.

# 3.ගුණ දම් පිරිහෙන සමාජයක එය රැක ගැනීම වෙනුවෙන් මගෙන් විය යුතු දේ.

- 1.මගේ දෙමාපියන්ට හා වැඩිහිටියන්ට කීකරු වෙමින් නිහතමානි දරුවෙකු ලෙස ජීවත් වෙමි.
- 2.අසරණ අයට උදවු කරමින්, අන් අයට ද ඒ ගැන දැනුවත් කරමි.
- 3.තරහව , ඊර්ෂ්‍යාව , වෛරය , පළිගැනීම වැනි දේවල් මගේ සිතින් ඉවත් කරමින් සැමට ම කරුණාව දක්වමි.
- 3.“යහපත් සමාජයක් උදෙසා ගුණ දම් රකිමු’ යන මාතෘකාව යටතේ , සාහිත්‍ය සමිතියේ  කතාවක් පවත්වමි.
- 4.අකීකරු යහළුවන් ළඟට ගොස් ආදරයෙන් කතා කරමින් ඔවුන්ව ද කීකරු යහළුවන් බවට පත් කිරීමට උත්සහ කරමි.

## 4.තාක්ෂණික දියුණුවත් සමඟ කාර්යබහුල ජීවිත ගත කරන මිනිසාට තව වසර 20කින් පසුව සිදු විය හැකි දේ

- 1. තාක්ෂණික මෙවලම් භාවිතය හේතුවෙන් , ව්‍යායාම අඩු වී රෝගීන් බවට පත් විය හැක.
- 2. තරඟකාරී ජීවන රටාවකට හුරු වීම නිසා ගුණ දම් පිරිහී යා හැක.
- 3.මුදල් පසු පස දිව යන බැවින් මානසික නිදහස අහිමි වී යා හැක.
- 4. කාර්යබහුලත්වය හේතුවෙන් පවුලේ සාමාජිකයින් සමඟ එකට සිටීමේ වේලාව ගිලි හී යනු ඇත.

# 5. අපේ ගම ගංවතුරෙන් යට වූ දා .

- 1. ගම්වැසියන් මහන්සියෙන් උපයා ගත් සියල්ල දිය රකුසාට බිලි විය.
- 2. බියෙන් හා දුකෙන් සුසුම්ලන මිනිසුන් උස් බිම් කරා පිය නැඟුවේ ය.
- 3.ආරක්ෂක හමුවෙන් පැමිණ සරණාගත අපට පිහිට වන්නට විය.
- 4. බොහෝ භාණ්ඩ හා උපකරණ දියෙ හී ගසා ගෙන යන්නට විය.